# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

නර්තන හා නාට්‍ය කලා පීඨය

ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධි පරීක්ෂණය

පළමුවන වසර පළමු අර්ධවාර්ෂිකය - 2019/2020 (2022 පෙබරවාරි)

මාර්ගගත ක්‍රමය මගින් පැවැත්වීම

## ප්‍රාසංගික කලා හැඳින්වීම - DDCT 11022

කාලය :- පැ 03

❖ සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

1. ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.
2. පෙ.ව. 9.00 ආරම්භ වී පැය 3ක් තුළ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා පැය 1.30ක් තුළ පිළිතුරු පත්‍ර උඩුගත කළ යුතුය.
3. ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංකයට වෙන් වෙන් වශයෙන් පිළිතුරු උඩුගත කළ යුතුය.
4. පිළිතුරු පත්‍රය PDF ලේඛනයක් ලෙස සකස්කර Rename කර LMS හි අදාළ ප්‍රශ්න අංකය සහිත ස්ථානයට උඩුගත කළ යුතුය. (නිදසුන් - DDCT 11022 performing arts – DD-19-001 – Qu 01…, )
5. පිළිතුරු ලබාදීමේ දී සෛද්ධාන්තික විභාග මාර්ගගත ක්‍රමවේදය මගින් පැවැත්වීමේ සංශෝධිත මාර්ගෝපදේශ මාලාව අනුගමනය කරන්න.
6. පිළිතුරු පත්‍රය උඩුගත කිරීමේ දී ගැටළුවක් වෙතොත් ඔබට අදාළ විභාග නිරීක්ෂකගෙන් උපදෙස් ලබාගන්න.
7. එක් පිළිතුරක් සඳහා ලකුණු 16 ක් හිමිවෙයි.

---

1 ''පරිභෝජනවාදි ගෝලීය සංස්කෘතිය හා විද්‍යුත් මාධ්‍ය භාවිතයන් හමුවේ උඩරට නර්තනයේ ප්‍රාසංගික බව නව්‍යකරණය වී තිබේ'' විමසන්න.

හෝ

ව්‍යවහාරික ප්‍රාසංගික කලාවන් හි නළුවා හෙවත් අභිවාහකයා මෙන් ම ප්‍රේක්ෂකයා ද තීරණාත්මක සාධකයක් බවට පත්වන්නේ කෙසේ දැයි විමර්ශනය කරන්න.

2 ශ්‍රී ලාංකේය ප්‍රාසංගික කලාව පූර්ව නූතන යුගයේ සිට ක්‍රමිකව විකාශනය වෙමින් පැවත ආ ආකාරය නිදර්ශන සහිත ව පැහැදිලි කරන්න .

හෝ

වෙස් මුහුණ යනු විවිධ රස ජනනය කළ හැකි අභිවාහකයෙක් දැයි ඔබ උගත් වෙස් මුහුණු පළඳින චරිත ඇසුරු කරමින් විමසුමට ලක් කරන්න.

3 බුදු දහමේ බලපෑම අග්නිදිග හෙවත් ගිණිකොණදිග ආසියානු ප්‍රාසංගික කලාවන්ගේ දක්නට ලැබෙන අයුරු නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

අ.පි.බ.

4 භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රයේ සඳහන් රස සංකල්පය විචාරාත්මක ව විමර්ශනය කරන්න.

හෝ

සබරගමු නර්තන සම්ප්‍රදායයේ සමකාලීන ප්‍රවණතා පිළිබඳ විමර්ශනයක යෙදෙන්න.

5 Covid – 19 වසංගතය ප්‍රාසංගික කලා කෙරෙහි සිදු කරන ලද බලපෑම පිළිබඳ ඔබ කැමති කලා භාවිතයක් ඇසුරෙන් විමසන්න.

හෝ

''Acrobatics'' ලෙස ලොව ප්‍රචලිත අභිවාහ්‍ය ක්‍රීඩාව පිළිබඳ හඳුන්වා දේශීය නර්තනයෙහි එකී ශිල්පය භාවිත වන්නේ කවර ආකාරයෙන් දැයි විමසුමට ලක් කරන්න.

6 ක්ෂණ භංගුර බව හෙවත් තාවකාලික බව (Ephemerality) ප්‍රාසංගික කලාවන් හි ආවේණික ලක්‍ෂණයක් වන්නේ කෙසේ දැ යි නිදසුන් සහිත ව පැහැදිලි කරන්න .

හෝ

රංග කලාව (Theatre) ප්‍රාසංගික කලා ප්‍රභේදයක් වන්නේ කවර හේතු නිසා දැ යි නිදර්ශනාත්මක ව විමර්ශනය කරන්න.

7 ඉතාලි පුනරුද සමයේ උපන් බැලේ නර්තන සම්ප්‍රදාය ව්‍යාප්ත වූ ආකාරය පිළිබඳව නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

8 ප්‍රාසංගික කලා නිර්මාණ සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය තාක්ෂණය භාවිත කළ හැකි ආකාර උදාහරණ සහිත ව පැහැදිලි කරන්න .

......................

**2022.02.12**